සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

8586

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II — කාලය / காலம் / Time: පැය 02යි. |

නම:.................................................... විභාග අංකය:....................................................

සැලකිය යුතුයි.
- පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු ලියන්න.
- දෙවන කොටසෙහි 01 හා 02 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.

## I කොටස

- පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි කොටසෙහි අර්ථය ඇති පිළිතුර තෝරන්න.

01. "ගුරු භවතා පමණක් නොව සිරිසෝම ද අන්ද මන්ද විය".
    1. කලහකාරී විය. 2. උපක්‍රමශීලී විය. 3. සිහිමුළා විය. 4. ප්‍රීතියට පත් විය.

02. "හොඳයි තමුන්නාන්සේ ඕනෑ කෙංගෙඩියක් කරගත්තට කාරි නෑ"
    1. වගාවක් 2. නිර්මාණයක් 3. වැදගත් දෙයක් 4. පලක් නැති දෙයක්

03. නිෂ්ඵල ක්‍රියාවක් සිදු කිරීම, දුදන ගුණ නොහැරීම යන අරුත් ඇති ප්‍රස්තාව පිරුළ හා ආප්තෝපදේශය ඇතුළත් පිළිතුරු යුගලය වන්නේ,
    1. අතු කඩා මොර කන්නා සේ - අවි ගත්තෝ අවියෙන් ම නසිති.
    2. අහසට ඉනිමං බැන්දා වගේ - අඟුරු කිරෙන් සේදුවත් සුදු නොවේ.
    3. ගඟට ඉනි කැපුවා වගේ - පෙරළෙන ගලේ පාසි නොබැඳේ.
    4. ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ - දිලිසෙන සියල්ල රන් නොවේ.

04. මුලින් දී ඇති පදයට සමානාර්ථ නො දෙන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. සිංහයා - කෙසරිඳු, බාසුරු, මීහිඳු, ගිජිඳු
    2. පියුම් - පද්ම, කමල, සියපත, අරවින්ද
    3. අම්මා - මව, මාතා, මෑණි, මෝ
    4. සොම්නස - ප්‍රහර්ෂය, අමන්දානන්දය, තුට, තොස

05. මුලින් දී ඇති පදයෙහි බහු අර්ථ නො දෙන පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. නා - නාගයා, නොපැමිණි, නා ගස, නායක 2. දද - කොඩි, මෝඩ, වණ, බමුණා
    3. වත - මුහුණ, වස්ත්‍රය, කථාව, වතුර 4. අඹ - ජලය, මව, ස්ත්‍රිය, වලාකුළ

06. මුලින් දී ඇති පදයෙහි විරුද්ධාර්ථ නොදෙන පද ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. සුලබ - බොහෝ, වැඩි, අධික, බහුල 2. ගුණ - නිර්ගුණ, අවගුණ, නුගුණ, අගුණ
    3. ආකුල - අනුකුළ, නිරාකුළ, ව්‍යාකුළ, අනාකුළ 4. මිතුරු - පිළිමල්, විරිදු, අමිතුරු, සතුරු

07. ඕෂ්ඨජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. ට, ඨ, ඩ, ඪ, ණ 2. ත, ථ, ද, ධ, න 3. ක, ඛ, ග, ඝ, ඞ 4. ප, ඵ, බ, භ, ම

08. අක්ෂර වින්‍යාසය වැරදි ලෙස යොදා ඇති පිළිතුර තෝරන්න.
    1. ශ්‍රේෂ්ඨ, පාපිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ, උත්කෘෂ්ට 2. පරිගණකය, මර්දනය, කරුණාව, පිළිවෙළ
    3. නිශ්චල, ආශ්වාස, නිෂ්පාදනය, නිශ්ඵල 4. කොට්ඨාසය, ප්‍රස්තාව පිරුළු, විස්මය, ආභාසය

09. අකාරාදී පිළිවෙළට නම් යෙදී ඇති පිළිතුර තෝරන්න.
    1. කැනඩාව, ග්‍රීසිය, තායිලන්තය, රුසියාව 2. නේපාලය, තායිවානය, මැලේසියාව, ප්‍රංශය
    3. හංගේරියාව, බෙල්ජියම, අප්‍රිකාව, නවසීලන්තය 4. භූතානය, මාලදිවයින, චීනය, සිරියාව

10. "සුගුණපාල ගුරුතුමා සිරිසෝම දෙස ගෞරවයෙන් බලා සිටියේ ය".
    ඉහත වාක්‍යයේ ඇති නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද වන්නේ,
    1. ගුරුතුමා - සිටියේ ය 2. සිරිසෝම - බලා
    3. සුගුණපාල - ගෞරවයෙන් 4. දෙස - සිටියේ ය

11. "කොළ මුහුද" ලෙස ධීවරයා දකින්නේ,
1. වෙරළේ සිට සැතපුම් බාගයක් පමණ විහිදී යන මුහුදයි.
2. කහ මුහුදේ සිට සැතපුමක් පමණ දුරට විහිදී යන නොගැඹුරු මුහුදයි.
3. නලවාලි මුහුදේ සිට සැතපුමක් පමණ දුරට විහිදී යන මුහුදයි.
4. නිල් මුහුදේ සිට සැතපුම් බාගයක් පමණ විහිදී යන මුහුදයි.

12. "අ" කොටසේ ඇති ක්‍රියා වර්ගවලට අයත් ක්‍රියාපද "ආ" කොටසට අයත් ක්‍රියාපද සහිත වාක්‍ය සමඟ ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
| --- | --- |
| අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා | A අමුත්තා දරුවා හඬවයි. |
| කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා | B හිරු පායත් ම පියුම් පිපෙයි. |
| ප්‍රයෝජ්‍ය ක්‍රියා | C නුඹ යමක් කිව්වොත් අපි එකඟ වෙමු. |

1. A B C 2. B A C 3. C B A 4. C A B

13. අසනිපාතය, කුළු ගැන්වීම යන පදවල අර්ථය පිළිවෙළින් නිවැරදිව දක්වෙන පිළිතුර වන්නේ,
1. මහා මේඝය - මිටි පහර දීම
2. හෙණ ගැසීම - මතු කිරීම
3. සුළි කුණාටුව - ආරම්භ වීම
4. රෝගාබාධය - කුල්ලෙන් පෙළීම

14. නිවැරදිව පද බෙදා ඇති වාක්‍යය තෝරන්න.
1. මධ්‍යකාලීන සිංහල කලාකෘතියේ ප්‍රස්තාවනාවෙහි ඔහු සිය අරමුණු දක්වා ඇත්තේ මෙසේය.
2. කඨින පෙරහැර පන්සලට ළඟා වන විට පන්සල් බිම සැදැහැතියන්ගෙන් පිරී යයි.
3. ධීවරයා "නවම් මහේ නව වළල්ල" දැක සතුට ට පත් වෙයි.
4. අලසයන් ලවා කරවන කුඹුරු වලින් නියමිත අස් වැන්න නොලැබේ.

15. "අ" කොටසේ ඇති නිපාත අර්ථ "ආ" කොටසේ ඇති වාක්‍ය සමග ගැළපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
| --- | --- |
| ආමන්ත්‍රණාර්ථය | A නංගී නොහොත් මම චාරිකාවට පැමිණෙමි. |
| උපමාර්ථය | B මේ සා උත්සාහයක් කවුරු ගනිත් ද? |
| ප්‍රමාණාර්ථය | C කවුද බොල ඒ තරුණ මුදලිතුමා |
| විකල්පාර්ථය | D දිසි රණලියෙව් රුසිරි යුත් මෙපුරඟන |

1. B C A D 2. C D B A 3. A C B D 4. A B C D

16. අවුරුද්දක් පාසා පැවැත්වෙන, කිසි ම ප්‍රයෝජනයක් නැති යන යෙදුම්වලට දිය හැකි තනි පද වන්නේ පිළිවෙළින්
1. වාර්ෂික - අප්‍රයෝජන
2. වාත්සරික - දුෂ්ප්‍රයෝජන
3. සාංවත්සරික - නිෂ්ප්‍රයෝජන
4. වාරික - විප්‍රයෝජන

17. ඔවා මුතු දම, වෙළෙන්දී, කුඩ හොරා, සින්දු කියන උණ පඳුර යන සාහිත්‍ය නිර්මාණ රචනා කළ ලේඛකයින් පිළිවෙළින් දක්වෙන පිළිතුර තෝරන්න.
1. කුමාරතුංග මුනිදාස, එස්. මහින්ද හිමි, රත්න ශ්‍රී විජේසිංහ, සිබිල් වෙත්තසිංහ
2. සිබිල් වෙත්තසිංහ, රත්න ශ්‍රී විජේසිංහ, එස්, මහින්ද හිමි, කුමාරතුංග මුනිදාස
3. එස්. මහින්ද හිමි, කුමාරතුංග මුනිදාස, සිබිල් වෙත්තසිංහ, රත්න ශ්‍රී විජේසිංහ
4. රත්න ශ්‍රී විජේසිංහ, එස්. මහින්ද හිමි, සිබිල් වෙත්තසිංහ, එස් මහින්ද හිමි

18. කර්මකාරක වාක්‍ය සම්බන්ධයෙන් නිවැරදි නොවූ ප්‍රකාශය තෝරන්න.
1. කර්මකාරක වාක්‍යවල දී උක්ත වන්නේ අනුක්ත පදය.
2. කර්මකාරක වාක්‍යයක අනුක්ත පදය කර්ම පදය කියා ද හඳුන්වයි.
3. කර්මකාරක වාක්‍යයක අවසාන ක්‍රියාව තැබිය යුත්තේ උක්ත වූ කර්මයට අදාළව ය.
4. කර්මකාරක වාක්‍යයක ආඛ්‍යාතය යනු අවසාන ක්‍රියාව නොවේ.

19. 19, 20 ප්‍රශ්න සඳහා ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.
1. සිඟිති දියණියෝ මිහිරි ගී ගැයුවා ය.
2. රැස්ව සිටි පිරිස අතරින් එක් කෙනෙක් පිළිතුරු දුන්හ.
3. සමහරු ගං වතුරේ ඔරු පදිති.
4. සිසුන් බොහෝ දෙනා ක්‍රීඩා කළේ ය.

20. 1. ඇත් මුළ මහ වනය දෙවනත් කරයි.
2. ගස් පෙළ ඉදිරි වැටෙයි.
3. ඇළ, දොළ, ගංගා මුහුදට ගලා බසිති.
4. සඟ ගණ පිරිත් දෙසයි.

(ලකුණු 02 × 20 = 40)

## II කොටස

- පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. පන්ති කාමරයේ දී ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
   (i) බිත්ති පුවත්පත සඳහා ඔබේ කණ්ඩායම ඉදිරිපත් කළ තේමාව කුමක් ද? (ල. 01)
   (ii) එම නිර්මාණය සකස් කිරීමේ දී ඔබ ලැබූ ගුරු උපදේශ දෙකක් ලියන්න. (ල. 04)
   (iii) බිත්ති පුවත්පත සඳහා ඔබ තොරතුරු ලබා ගත් ක්‍රම දෙකක් ලියන්න. (ල. 04)
   (iv) බිත්ති පුවත්පතට ලිපියක් ලිවීමේ දී ඔබ සැලකිලිමත් විය යුතු කරුණු තුනක් ලියන්න. (ල. 03)
   (v) බිත්ති පුවත්පත සකස් කිරීමෙන් ඔබ ලබා ගත් කුසලතා දෙකක් ලියන්න. (ල. 04)
   (ලකුණු 16)

02. පහත සඳහන් අ, ආ, ඇ, ඈ, ඉ යන කොටස්වලින් එකක් තෝරා ගෙන වචන 200කට නො අඩු වන සේ රචනයක් ලියන්න.
   (අ) අහස උසට නැඟුණු දාගැබ්, සයුර පරයන වැව් අමුණු, මහා ගල් කණු, සීගිරිය වැනි නිර්මාණ කියා පාන්නේ ජාතියේ අභිමානය යි. අවුරුදු දෙදහස් පන්සියයකට වඩා ඉපැරණි අතීතයකට අපි උරුමකම් කියන්නෙමු. මියෙනතුරු ඉපදුණු මේ රටට සේවය කිරීම අපේ යුතුකම හා වගකීම යි. ඒ අනුව ''මා දිනූ රට මට අගේ ය'' යන මාතෘකාවෙන් රචනයක් ලියන්න.
   (ආ) මාර්ග නීති ආරක්ෂා කිරීමේ පුරුදුවලින් රියදුරු හා මඟී ජනතාව පරිපූර්ණ විය යුතු ය. එවිට දිනපතා ඉහළ යන මාරක රිය අනතුරු සංඛ්‍යාව අඩු කර ගත හැකි වනු ඇත. මේ සඳහා අදාළ රජයේ ආයතන මෙන් ම මඟී ජනතාව ද කඩිනමින් පෙළ ගැසිය යුතු ය. ඒ අනුව ''පරදමු - මගමරු'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.
   (ඇ) නූතන සමාජයේ භීෂණය, දූෂණය පැතිරෙමින් පවතී. බල ලෝභය, වෛරය පළිගැනීම මීට හේතුව යි. සමාජය පිළිගත් යහපත් චර්යාවන් මගින් සාමූහික සාරධර්මයන් වර්ධනය කර සමාජ ගැටලු අවම කරගත හැකි ය. උපදේශ ලබා දෙන්නට ම ලියවුණු පොත පත සිංහල සාහිත්‍යයේ පැවතීම වාසනාවකි. ඒ ඇසුරින් ''වඩවමු සරුදම් - සුරකිමු ගුණදම්'' යන මාතෘකාවෙන් රචනයක් ලියන්න.
   (ඈ) විවිධ අවශ්‍යතා සඳහා වරින්වර අප රටට විවිධ ජන කොටස් පැමිණි හා සමූහ වශයෙන් ගෙන්වා ගැනුණු අවස්ථා ඉතිහාසයේ සඳහන්ව ඇත. ඔවුහු මේ බිමේ ස්ථිර පදිංචිකරුවෝ වූහ. මවුබිමේ සංවර්ධනයට තම ජීවිත කැප කළහ. තම සම්ප්‍රදායයන් රැක ගනිමින් සුඛිත මුදිත දිවියක් ගෙවීම සඳහා ඉඩ ලබා දීම මුළු මහත් සමාජයේ ම වගකීමකි. ''මෙත් වඩමු - රට නගමු'' මැයෙන් රචනාවක් ලියන්න.
   (ඉ) දරුවන් උදෙසා ලියන ලද කතා කවි නාට්‍ය ආදී නිර්මාණ දරුවා අපූරු ලෝකයකට ගෙන යන සාහිත්‍යාංගයන් ය. එබඳු ළමා සාහිත්‍ය නිර්මාණය කිරීම සඳහා වෙහෙස වූ ලේඛකයෝ බොහෝ වෙති. ඔවුහු තම නිර්මාණ මගින් ජාතියේ ළමා සම්පත සංවර්ධනය කරති. ඒ ඇසුරින් ''මගේ සොඳුරු - මහා ගත්කරු'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න. (ලකුණු 14)

03. ඔබගේ පාසලේ 2019 වර්ෂාවසාන අධ්‍යාපනික සැණකෙළියේ එක් විශේෂාංගයක් ලෙස පොත් ප්‍රදර්ශනයක් සහ අලෙවි සැලක් පැවැත්වීමට අදහස් කරයි. මේ සඳහා පොත්-පත් ලබා ගැනීම ඉතා වැදගත් කාර්යයකි. මෙම කටයුත්ත සඳහා දායකත්වය ලබා දෙන ලෙස ඉල්ලමින් මරදාන, එස්. ගොඩගේ පොත් ප්‍රකාශන ආයතනයට යවන ලිපියක් ලියන්න. ඔබ පාසලේ සාහිත්‍ය සංගමයේ ලේකම් යැයි සිතන්න.
   (ලකුණු 10)

04. පහත සඳහන් ප්‍රකාශ කියවා ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
   (අ) ''තරහා ගන්න එපා, සර් අපි මේ කරන්නෙත් අසරණ දරුවන්ගේ ඉගෙනීමට උදව් දීමක් තමා''.
      (i) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?
      (ii) මෙම ප්‍රකාශය කළ තැනැත්තාගේ වෘත්තිය කුමක් ද?
   (ආ) ''හෙට හවස මාත් එක්ක කැකිරාවට යන්න ලැස්තිවෙලා එන්න පුළුවන් ද?''.
      (i) ඉහත ප්‍රකාශය කළේ කාහට ද?
      (ii) ඔවුන් කැකිරාවට ගියේ ඇයි?
   (ඇ) ''ඒ මිනිහා දැන් මෙතන ඉන්නව ද?''.
      (i) මෙම ප්‍රකාශය ඇතුළත් සාහිත්‍ය නිර්මාණයේ රචකයා කවුරුන් ද?
      (ii) ඉහත ප්‍රකාශයේ සඳහන් ''ඒ මිනිහා'' කවුරුන් ද?

(ඇ) "එක් පාන වර්ගයෙ කෑ".
   (i) මෙලෙස ප්‍රකාශ කළේ කවුරුන් ද?
   (ii) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටාගත් ග්‍රන්ථයේ රචකයා නම් කරන්න.

(ඉ) "ඔහු ඉතා නිර්මාණශීලී මිනිහෙක්".
   (i) ඉහත ප්‍රකාශය කළේ කවුරුන් ද?
   (ii) එම ප්‍රකාශය කළේ කුමන ස්ථානයකදී ද? (ලකුණු 02 × 05 = 10)

05. පහත සඳහන් ඡේදය වචන 20 - 25 අතර සංඛ්‍යාවකින් සාරාංශ කර ලියන්න. (සාරාංශය අවසානයේ වචන සංඛ්‍යාව ලියන්න.)

ශ්‍රී ලංකාවේ ඇතැම් පැරණි ගොඩනැගිලිවල පියගැටපෙළ පාමුල අර්ධ කවාකාර ගල් පුවරුවක් ඇත. අනුරාධපුර යුගයේ මුල් කාලයේ කැටයමින් තොරව නිර්මාණය වූ මේ ගල්පුවරුව පසු කාලීනව මනරම් කැටයම් සමූහයකින් අලංකාර වී ගැඹුරු අර්ථයක් ප්‍රකට කරන අපූරු කලා නිර්මාණයක් බවට පත් විය. හැඩයෙන් අඩ සඳකට සමාන වන නිසා "සඳකඩ පහණ" යන නමින් හැඳින්වුණු මෙම මාහැඟි වස්තුව පැරණි ශිල්පීන්ගේ කලා කෞශල්‍යයත් අපේ සංස්කෘතියේ විශිෂ්ටත්වයත් ලෝකයා හමුවේ විදහා දක්වන අපූර්ව නිර්මාණයකි. (ලකුණු 10)

06. පහත සඳහන් පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

යදියෙකි පොහොසතෙකි දිළිඳෙකි කුලවතෙකි
සැඬොලෙකි නිවටයෙකි බලැතෙකි සිරිමතෙකි
කිවහැකි එක ම උරුමය සහ එක ගතෙකි
මිනිහෙකි මේ බෙදුනෙ මොහු පුදුමම සතෙකි

අව්වට වියළි වැස්සට තෙමී තෙමී නිතර
කුඹුරෙහි නියැලි මිනිහයි කම්හල් අතර
දහදුක් විඳින එම කම්කරුවයි විතර
දෙවියෙක් නැත ලොවෙහි නිසි ගුණයෙන් ළතර

දුගුණෙන් පිරී එය තව තව සුරක්සිත
කරමින් වෙසෙන හිස ඉදිමුණු කමක් ගත
මිනිසුන් හට අනේ මේ වැනි ලොවක් මත
ඉඳුරන් පහෙන් මිස මොළයෙන් පලක් නැත

(මීමන ප්‍රේමතිලක)

(i) කවියා ප්‍රථම පද්‍යයෙන් හඳුන්වා ඇති පරිදි මිනිසාගේ ස්වරූප දෙකක් නම් කරන්න.
(ii) "පුදුම සතෙක්" ලෙස මිනිසා හැඳින්වීමට හේතුව කුමක් ද?
(iii) දෙවන පද්‍යයට අනුව කවියා දෙවියන් සේ දකින වෘත්තිකයන් නම් කරන්න.
(iv) මොළයෙන් පලක් නැති මිනිසුන් ලෙස කවියා හඳුන්වා දෙන්නේ කවරාකාරයේ මිනිසුන් ද?
(v) දුගුණෙන්, ඉඳුරන් යන පදවල අර්ථ ලියන්න. (ලකුණු 02 × 05 = 10)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

අනුපම කවිත්වයක් අපූර්ව නිර්මාණ කෞශල්‍යයත් නිසා භාරතීය කවීන් අතර අග්‍රගණ්‍ය ලෙස අවිවාදයෙන් පිළි ගැනෙන්නේ කාලිදාස මහා කවියා ය. කාව්‍ය, නාට්‍ය යන විෂයයන් දෙකෙහි ම ඒකාකාරව සිය නිර්මාණ ශක්තිය විදහා දක්වන කාලිදාස කොපමණ ශ්‍රේෂ්ඨ සාහිත්‍යධරයෙකු ලෙස සලකනු ලැබේ දැයි කිවහොත් ඔහු නාට්‍ය රචකයෙකු හා කවියෙකු වශයෙන් විශ්ව කීර්තියට පත්ව ඇති ඉංග්‍රීසි ජාතික විලියම් ෂේක්ස්පියර්ට සමාන කොට දැක්වීමට විචේචකයෝ පෙළඹෙත්. කාලිදාස සහ ෂේක්ස්පියර් යන දෙදෙනාට ම වෙසෙසින් ම සමානකම් දක්වන වැදගත් ලක්ෂණයක් ඔවුන්ගේ කෘතීන්හි පිළිබිඹු වේ. එනම් කාව්‍ය ශෛලියත් නාට්‍ය ශෛලියත් නිරුත්සාහයෙන් ම මුසු කොට ඒ දෙකෙන් අන්‍යෝන්‍ය නෑ සබඳකමක් ජනිත කොට දැක්වීමයි.

(i) භාරතීය කවියන් අතර අග්‍රගණ්‍ය මහා කවියා නම් කරන්න.
(ii) ඔහු එලෙස හැඳින්වීමට හේතුව කුමක් ද?
(iii) ෂේක්ෂ්පියර් කවියා විශ්ව කීර්තියට පත්ව ඇත්තේ කෙබඳු නිර්මාණ සම්බන්ධයෙන් ද?
(iv) ඡේදයේ සඳහන් පරිදි කාලිදාස සහ ෂේක්ස්පියර් යන කවීන් දෙදෙනා සමානකම් දක්වන්නේ කුමක් සම්බන්ධයෙන් ද?
(v) අනුපම, ජනිත යන වචනවල අර්ථ පැහැදිලි කරන්න. (ලකුණු 02 × 05 = 10)